සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

යුරෝපා ඉතිහාසය II (I කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி I)
History of Europe II (Part I)

25 B | S | II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

විභාග අංකය: ....................................

**උපදෙස්:**
* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* මෙම කොටසට **ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) තේම්ස් (2) එල්බ් (3) ඩැන්සිග්
(4) විස්ටියුලා (5) පෝ (.........)

**2.** (1) තීබ්ස් (2) මෙගාර (3) ඩෙල්ෆි
(4) ආර්ගෝස් (5) පොම්පෙයි (.........)

**3.** (1) ඇක්‍රොපොලිස් (2) බොලොඤ්ඤා (3) පැරිස්
(4) ඔක්ස්ෆඩ් (5) පාදුවා (.........)

**4.** (1) ඊස්කිලස් (2) සොෆොක්ලීස් (3) යුරිපිඩීස්
(4) ටැසිටස් (5) ඇරිස්ටොෆනීස් (.........)

**5.** (1) මිනොවන්වරු (2) ඔස්ට්‍රොගොත්වරු (3) ඇන්ග්ලො-සැක්සන්වරු
(4) ලොම්බාර්ඩ්වරු (5) ෆ්‍රෑන්ක්වරු (.........)

**6.** (1) නිකොලස් කොපර්නිකස් (2) ෆ්‍රැන්සිස්කො පිසාරෝ (3) ගැලීලියෝ ගැලිලි
(4) ජොහැන්නස් කෙප්ලර් (5) අයිසැක් නිව්ටන් (.........)

**7.** (1) බොහිමියන් අවධිය (2) ඩේනිෂ් අවධිය (3) ජර්මන් අවධිය
(4) ස්වීඩිෂ් අවධිය (5) ප්‍රංශ අවධිය (.........)

**8.** (1) මහා ෆ්‍රෙඩ්රික් (2) ලුවී පිලිප් (3) මහා කැතරින්
(4) මරියා තෙරේසා (5) දෙවන ජෝශප් (.........)

[දෙවැනි පිටුව බලන්න.

**9.** (1) කෝසිකා (2) සිසිලි (3) එල්බා
(4) ශාන්ත හෙලේනා (5) ක්‍රොඒෂියා (.........)

**10.** (1) ලොයිඩ් ජෝර්ජ් (2) ජෝර්ජ් ක්ලෙමන්සො (3) විටෝරියෝ ඕලැන්ඩෝ
(4) ජෝශප් ස්ටාලින් (5) වුඩ්රෝ විල්සන් (.........)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) සියුස් - ඔලිම්පියා
(2) ඇතීනා - ඇතන්ස්
(3) ජුපිටර් - ස්පාර්ටා
(4) ඇපොලෝ - ඩෙල්ෆි
(5) ඇෆ්‍රොඩයිටී - කොරින්ත් (.........)

**12.** (1) ක්ලිස්තීනීස් - ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා
(2) හිපොක්‍රටීස් - වෛද්‍ය විද්‍යාවේ පියා
(3) හෙරොඩෝටස් - ඉතිහාසයේ පියා
(4) පෙට්රාක් - මානවවාදයේ පියා
(5) ලුවී බ්ලාන්ක් - විද්‍යාත්මක සමාජවාදයේ පියා (.........)

**13.** (1) බයිසැන්ටයින් අධිරාජ්‍යය - කොන්ස්තන්තිනෝපලය
(2) ඔටොමන් අධිරාජ්‍යය - ජෙරුසලම
(3) ඔස්ට්‍රියානු අධිරාජ්‍යය - වියනා
(4) ප්‍රංශ අධිරාජ්‍යය - පැරිස්
(5) ජර්මන් අධිරාජ්‍යය - බර්ලින් (.........)

**14.** (1) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(2) තිස් අවුරුදු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(3) හත් අවුරුදු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(4) ක්‍රිමියානු යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි.
(5) පළමුවන ලෝක යුද්ධය - එංගලන්තය පාර්ශවකරුවෙකි. (.........)

**15.** (1) තොමස් හොබ්ස් - ලෙවියතාන් (Leviathan)
(2) ජොන් ලොක් - ආණ්ඩුව පිළිබඳ ගැඹුරු නිබන්ධන දෙක (Two Treatises of Government)
(3) ජීන් ජැක් රූසෝ - නීතියේ සාරය (The Spirit of the Laws)
(4) ඇඩම් ස්මිත් - ජාතීන්ගේ ධනය (Wealth of Nations)
(5) වී. අයි. ලෙනින් - රජය සහ විප්ලවය (State and Revolution) (.........)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | Y |
|---|---|---|
| **16.** | (i) ජූලියස් සීසර් | A "තත්කාලීන වැදගත් ප්‍රශ්න විසඳනු ලබන්නේ කථා පැවැත්වීමෙන් හෝ බහුතරයකගේ යෝජනා සම්මත කිරීමෙන් හෝ නොව......... ලෙයින් සහ යකඩෙනි." |
| | (ii) දාහතරවන ලුවී | B "විප්ලවය යනු මම වෙමි." |
| | (iii) නැපෝලියන් බොනපාට් | C "බෝල්ටික් මුහුදේ සිට අද්‍රියාතික් මුහුද දක්වා [යුරෝපා] මහද්වීපය හරහා අයෝමය තිරයක් වැටී ඇත." |
| | (iv) ඔටෝ ෆොන් බිස්මාර්ක් | D "මම පැමිණියෙමි, මම දුටිමි, මම ජයගතිමි." |
| | (v) වින්ස්ටන් චර්චිල් | E "රජය යනු මම වෙමි." |

(1) ABECD (2) AEDCB (3) BAECD (4) DEABC (5) DEBAC (.........)

| | X | | Y |
|---|---|---|---|
| 17. | (i) අඟුරු මහද්වීපය | A | බ්‍රිතාන්‍යය |
| | (ii) නව ලෝකය | B | අප්‍රිකාව |
| | (iii) සාප්පුකාර ජාතිය | C | ඉතාලිය |
| | (iv) භූගෝලීය ප්‍රකාශනයක් පමණකි. | D | තුර්කිය |
| | (v) යුරෝපයේ රෝගියා | E | අමෙරිකාව |

(1) ABDEC (2) BADEC (3) BAECD (4) BEACD (5) CDAEB (.........)

| | X | | Y |
|---|---|---|---|
| 18. | (i) බැස්ටීලය බිඳ හෙළීම | A | අමෙරිකා එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයට ඇතුළුවීම |
| | (ii) ස්පාඤ්ඤ වණය | B | දෙවන ලෝක යුද්ධයේ අවසානය |
| | (iii) ෆ්‍රැන්සිස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා ඝාතනය කිරීම | C | නැපෝලියන් බොනපාට්ගේ වැටීම |
| | (iv) පර්ල් වරායට එල්ල කළ ජපන් ප්‍රහාරය | D | ප්‍රංශ විප්ලවය ආරම්භ වීම |
| | (v) හිරෝෂිමා සහ නාගසාකි වෙත පරමාණු බෝම්බ හෙළීම | E | පළමුවන ලෝක යුද්ධය ආරම්භ වීම |

(1) DCEAB (2) DCEBA (3) DEABC (4) EACDB (5) ECADB (.........)

| | X | | Y |
|---|---|---|---|
| 19. | (i) වී. අයි. ලෙනින් | A | රතු හමුදාව |
| | (ii) ලියොන් ට්‍රොට්ස්කි | B | බටහිර සමඟ සාමකාමී සහජීවනය |
| | (iii) ජෝශප් ස්ටාලින් | C | ග්ලස්නොස්ට් (විවෘතභාවය) සහ පෙරෙස්ත්‍රොයිකා (ආර්ථික ප්‍රතිව්‍යුහකරණය) |
| | (iv) නිකිතා කෘෂ්චෙෆ් | D | පස් අවුරුදු සැලැස්ම |
| | (v) මිහායල් ගර්බචෙෆ් | E | නව ආර්ථික ප්‍රතිපත්තිය |

(1) ACEBD (2) AEDBC (3) DEACB (4) EADBC (5) EDACB (.........)

| | X | | Y |
|---|---|---|---|
| 20. | (i) ට්‍රිග්වි ලී | A | බුරුමය |
| | (ii) ඩැග් හැමර්ෂල් | B | නොර්වේ |
| | (iii) ඌ තාන්ට් | C | ඔස්ට්‍රියාව |
| | (iv) කුට් වෝල්ඩ්හයිම් | D | පේරු |
| | (v) ජාවියර් පෙරේස් ඩී කුවෙලාර් | E | ස්වීඩනය |

(1) BEACD (2) CABED (3) CEABD (4) DECBA (5) EDABC (.........)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ.** එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ග්‍රීක පෞර රාජ්‍ය**

(1) ග්‍රීක පෞර රාජ්‍යය "පෝලිස්" නමින් හැඳින්විණි.
(2) ග්‍රීක පෞර රාජ්‍ය ක්‍රි.පූ. අටවන සියවසේ දී ආරම්භ විය.
(3) ග්‍රීක පෞර රාජ්‍යය, භූමි ප්‍රමාණය හා ජනගහණය යන දෙඅංශයෙන්ම එකිනෙකින් වෙනස් විය.
(4) පෙරික්ලීස්ගේ සමයේ දී ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදය පරිපූර්ණත්වයට පත්විය.
(5) පෙලපොනීසියානු යුද්ධය ග්‍රීකයන් හා පර්සියානුවන් අතර හටගත්තේ ය. (.........)

**22. කිතු දහම**

(1) කිතු දහම ඒක දේවවාදී ආගමකි.
(2) ක්‍රි.ව. තුන්වන සියවස තෙක් රෝම පාලකයෝ කිතුනුවන්ට වධ හිංසා කළහ.
(3) ක්‍රි.ව. තුන්වන සියවස අවසාන වනවිට කිතු දහම රෝම අධිරාජ්‍යය පුරාම වාගේ පැතිර පැවතුණි.
(4) ඩේසියස් නම් රෝම අධිරාජයා කිතුනුවන්ට වධ හිංසා කිරීම අවසන් කළේය.
(5) කිතු දහම තියඩෝසියස් විසින් රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් කරනු ලැබීය. (.........)

**23.** **වැඩවසම් ක්‍රමය**

(1) මධ්‍යතන යුරෝපයේ දේශපාලන හා ආර්ථික ක්‍රමය වැඩවසම් ක්‍රමය නමින් හඳුන්වනු ලැබේ.
(2) වැඩවසම් ක්‍රමය ෆ්‍රැන්ක් රාජධානියෙහි ආරම්භ වී යුරෝපයේ අන් ප්‍රදේශවලට පැතිර ගියේය.
(3) වැඩවසම් ක්‍රමය යටතේ මධ්‍යම පාන්තිකයෝ රජයෙන් ඉඩම් ලබාගෙන රජුට සේනා සැපයූහ.
(4) වැඩවසම් ක්‍රමය ප්‍රවේණිගම් ක්‍රමය (බණ්ඩාරගම් ක්‍රමය) මත ගොඩනැගී තිබුණි.
(5) වැඩවසම් ක්‍රමය යටතේ දේශපාලන බලය විකේන්ද්‍රගතව පැවතුණි. (.........)

**24.** **ආගමික ප්‍රතිසංස්කරණය**

(1) ආගමික ප්‍රතිසංස්කරණය ජර්මනියේ ආරම්භ විය.
(2) ආගමික ප්‍රතිසංස්කරණය පුනරුදය ඇතිවීමට මඟ පෑදීය.
(3) කතෝලික සභාව ආශ්‍රිතව පැවති දූෂණ, ආගමික ප්‍රතිසංස්කරණය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන හේතුවකි.
(4) මාටින් ලූතර් ආගමික ප්‍රතිසංස්කරණයේ ආරම්භකයා ලෙස සැලකේ.
(5) 1517 දී කරුණු අනූ පහකින් යුත් ලියවිල්ලක් විටෙන්බර්ග් දේවස්ථාන දොරටුවේ සවි කිරීම ආගමික ප්‍රතිසංස්කරණයේ ආරම්භය සලකුණු කරයි. (.........)

**25.** **පළමුවන ලෝක යුද්ධය**

(1) පළමුවන ලෝක යුද්ධය 1914 දී ආරම්භ විය.
(2) ජර්මනිය, ඔස්ට්‍රියා-හංගේරියාව, තුර්කිය සහ බල්ගේරියාව මධ්‍යම බලවතුන් ලෙස හැඳින්විය.
(3) රුසියාව, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ඉතාලිය හා අමෙරිකා එක්සත් ජනපදය මිත්‍ර ජාතීන් ලෙස හැඳින්විය.
(4) වර්සායි ගිවිසුම ජර්මනිය සමඟ අත්සන් කරන ලදී.
(5) ශාන්ත ජර්මේන් ගිවිසුම තුර්කිය සමඟ අත්සන් කරන ලදී. (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........ **5** ද, **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** 15 වන හා 16 වන සියවස්වල ඇති වූ දේශ ගවේෂණ සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) මුල්ම දේශ ගවේෂණ මුහුදු යාත්‍රික ගමන් පෘතුගීසීන් හා ස්පාඤ්ඤයන් විසින් සිදු කරන ලදී.
(B) දේශ ගවේෂණ මුහුදු යාත්‍රික ගමන්වල ප්‍රධාන අරමුණ වූයේ ආසියාවට ළඟාවීම සඳහා නව මාර්ගයක් සොයා ගැනීමයි.
(C) ෆර්ඩිනන්ඩ් මැගලන් අමෙරිකා මහද්වීපය සොයා ගත්තේ ය.
(D) වෝල්ටර් රැලේ ලෝ වටා යාත්‍රා කළේ ය. (.........)

**27.** 1688-89 උත්කෘෂ්ට විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) දෙවන ජේම්ස් සිහසුනෙන් පහකරන ලදී.
(B) මේරි හා ඔරෙන්ජ්හි විලියම් එංගලන්තයේ සම පාලකයන් බවට පත් වූහ.
(C) උත්කෘෂ්ට විප්ලවය, එංගලන්තයේ ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් සඳහා පදනම දැමීය.
(D) අයිතිවාසිකම් පනත නීතියක් බවට පත්විය. (.........)

**28.** රිචලියූ සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) පහළොස්වන ලුවී රජතුමාගේ ප්‍රධාන ඇමතිවරයා ලෙස සේවය කළේය.
(B) රජතුමාගේ හා මධ්‍යම ආණ්ඩුවේ බලය වර්ධනය කිරීමට පියවර ගත්තේ ය.
(C) රදළ ප්‍රභූවරුන්ගේ බලතල හා වරප්‍රසාදවලට ප්‍රහාර එල්ල කළේ ය.
(D) හියුගනෝවරුන්ට අනුග්‍රහ දැක්විය. (.........)

**29.** ආදි තන්ත්‍රය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ආදි තන්ත්‍රය යටතේ ප්‍රංශ සමාජය ප්‍රජා ගණ තුනකට බෙදී පැවතුණි.
(B) ආදි තන්ත්‍රය යටතේ සමූහාණ්ඩු පාලනයක් පැවතුණි.
(C) පූජක පන්තිය හා රදළ පන්තිය යන දෙපිරිසම විශේෂ වරප්‍රසාද භුක්ති වින්දාහ.
(D) ප්‍රංශය හා එංගලන්තය අතර අත්සන් කරන ලද ඊඩන් ගිවිසුම ප්‍රංශ ආර්ථිකය වැඩි දියුණු කිරීමට ආධාර විය. (.........)

**30.** තුෂ්ණී යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය අතර පැවති දේශපාලන හා දෘෂ්ටිවාදීමය ගැටුම 'තුෂ්ණී යුද්ධය' යනුවෙන් හඳුන්වනු ලැබේ.
(B) 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය පිහිටුවන ලදී.
(C) 1955 දී වෝර්සෝ සම්මුතිය අත්සන් කරන ලදී.
(D) 1989 දෙසැම්බර් මස අමෙරිකානු හා රුසියානු නායකයෝ "තුෂ්ණී යුද්ධය" නිල වශයෙන් අවසන් බව ප්‍රකාශ කළහ. (.........)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** මිලාන් ආඥාව ප්‍රකාශයට පත් කරන ලද්දේ කුමන රෝම අධිරාජයා විසින් ද?
(1) මාකස් අවුරේලියස් (2) ඩයක්ලීෂියන් (3) වැලේරියන්
(4) කොන්ස්ටන්ටයින් (5) තියඩෝසියස් (.........)

**32.** හත් අවුරුදු යුද්ධය නිමාවට පත්කළ සාම ගිවිසුම කුමක් ද?
(1) ඔග්ස්බර්ග් සාම ගිවිසුම (2) පැරිස් සාම ගිවිසුම
(3) ඒමියන්ස් සාම ගිවිසුම (4) පෝර්ට්ස්මත් සාම ගිවිසුම
(5) රෝම සාම ගිවිසුම (.........)

**33.** උපයෝගීතාවාදය සවිස්තරාත්මකව අර්ථ දක්වන ලද්දේ කවුරුන් විසින් ද?
(1) තොමස් මෝල්තස් (2) ඩේවිඩ් රිකාර්ඩෝ (3) ජෙරමි බෙන්තම්
(4) රොබට් ඕවන් (5) ෆ්‍රෙඩ්රික් එන්ගල්ස් (.........)

**34.** සත් සති යුද්ධය ඇති වූයේ කුමන රටවල් අතර ද?
(1) ප්‍රංශය හා එංගලන්තය (2) රුසියාව හා තුර්කිය
(3) ඔස්ට්‍රියාව හා සාර්ඩිනියාව (4) ඔස්ට්‍රියාව හා ප්‍රශියාව
(5) ප්‍රංශය හා ප්‍රශියාව (.........)

**35.** සියලු මිනිසුන් වෙත ඉහළම සෞඛ්‍ය මට්ටමක් අත්පත් කර දීමේ පුළුල් අරමුණෙන් යුතුව පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ විශේෂිත ඒජන්සිය කුමක් ද?
(1) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(2) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(3) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
(4) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
(5) එක්සත් ජාතීන්ගේ සහන හා වැඩ ඒජන්සිය (UNRWA) (.........)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | පුරාණ ග්‍රීකයෝ විශ්වයේ වඩාත්ම වැදගත් සත්වයා ලෙස මනුෂ්‍යයා උත්කර්ෂයට නැංවූහ. | ක්‍රි. පූ. අටවන සියවසේ දී හෝමර්, ලයිසියම් නම් පාසැලක් ආරම්භ කරන ලදැයි විශ්වාස කෙරේ. | (.........) |
| **37.** | දේව වරම්වාදය යනු රජවරුන් දෙවියන් වහන්සේට පමණක් වගකිව යුතුය යනුවෙන් ප්‍රකාශ කළ මතවාදයකි. | දාහත්වන සියවසේ දෙවන භාගයේ ප්‍රංශයේ දාහතරවන ලුවී රජුගේ රාජාණ්ඩුව දේව වරම්වාදී සිද්ධාන්තය මත පදනම්ව පැවතුණි. | (.........) |
| **38.** | ස්වකීය ජනතාවගේ ආගම ලෙස ලූතර් දහම හෝ කතෝලික දහම හෝ තෝරා ගැනීමට සෑම ජර්මන් කුමාරයෙකුටම නිදහස ඇතැයි නැන්ටීස් ආඥාවෙන් නියම කෙරිණි. | 1806 දී නැපොලියන් බොනපාට් ශුද්ධ රෝම අධිරාජ්‍යය අහෝසි කළේය. | (.........) |
| **39.** | විප්ලව වර්ෂය ලෙස හැඳින්වෙන එක්දහස් අටසිය හතලිස් අට නූතන යුරෝපා ඉතිහාසයේ සන්ධිස්ථානයක් වශයෙන් සැලකිය හැකිය. | එක්දහස් අටසිය හතලිස් අට, ප්‍රංශ විප්ලවයෙන් ආරම්භ වූ විප්ලව සමයේ අවසානයත්, යුරෝපයේ රටවල් කීපයකම සාර්ථක ජාතික සටන් ව්‍යාපාරවල ආරම්භයත් සලකුණු කරයි. | (.........) |
| **40.** | ලන්ඩන් ගිවිසුම, යුරෝපා ආර්ථික සංගමය පිහිටුවීය. | 1949 දී චාල්ස් ඩි ගෝල් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ පළමුවන චාන්සලර්වරයා බවට පත්විය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| යුරෝපා ඉතිහාසය II<br>ஐரோப்பிய வரலாறு II<br>History of Europe II | 25 B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | S | II

**යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

**උපදෙස්:**
- ✳ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ✳ **පළමුවන** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) මධ්‍යධරණී මුහුද (ii) ක්‍රීට් (iii) රෝමය

(iv) ඩැනියුබ් ගඟ (v) කැස්පියන් මුහුද (vi) පෝ ගඟ

(vii) බොස්පරස් සමුද්‍ර සන්ධිය (viii) පෝලන්තය (ix) ජිනීවා

(x) නෝර්වේ (xi) ලිවර්පූල් (xii) ඩැන්සිග්

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)*

## B කොටස

**2.** පෞර රාජ්‍යයක සිට විශාල අධිරාජ්‍යයක් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 16 යි)

**3.** "පුනරුදය මූලික වශයෙන් සංස්කෘතික ව්‍යාපාරයකි."

(i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) පුනරුදයට අනුග්‍රහ දැක්වූවන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) පුනරුදය ඇතිවීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 05 යි)

(iv) කලාව, භාෂා සහ සාහිත්‍යය යන ක්ෂේත්‍රවල පුනරුදයේ කාර්ය සිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරමින් සංස්කෘතික ව්‍යාපාරයක් ලෙස එහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි)

**4.** පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අමෙරිකන් විප්ලවය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

(i) විප්ලවය ඇති වූ පසුබිම (ලකුණු 08 යි)

(ii) ඉන් උද්ගත වූ ප්‍රතිඵල (ලකුණු 08 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ග්‍රීක ආගම හා දර්ශනය

(ii) හත්වන හෙන්රි **හෝ** අටවන හෙන්රි **හෝ** යටතේ එංගලන්තය

(iii) එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වූ පසුබිම

(iv) නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්තිය

*(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගින්)*

[අටවැනි පිටුව බලන්න.

## C කොටස

**6.** වික්ටර් එමැනුවෙල් රජු, කැවුර් හා ගැරිබෝල්ඩි යන්නවුන්ගේ භූමිකා අගයමින්, 1848 සිට 1870 දක්වා වූ කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න.

(ලකුණු 16 යි)

**7.** " 1917 බොල්ෂෙවික් විප්ලවය රුසියාව තුළ දිගු කාලීන වෙනස්වීම් ඇති කළේ ය."

(i) 1917 වන විට රුසියාව පාලනය කළ අවසාන සාර්වරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) බොල්ෂෙවික් විප්ලවයේ නායකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) බොල්ෂෙවික්වරුන්ට රුසියාවේ බලය අල්ලා ගැනීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) 1917 බොල්ෂෙවික් විප්ලවය රුසියාව තුළ දිගුකාලීන වෙනස්වීම් ඇති කළ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**8.** අන්තර් යුද්ධ සමය තුළ ජර්මනියෙහි නට්සිවාදය නැගී ඒමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.

(ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) වියනා සම්මේලනය

(ii) බිස්මාර්ක්

(iii) බෙනිටෝ මුසෝලිනී

(iv) 1980 තෙක් සාම සාධක ආයතනයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ භූමිකාව

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

නූතන ලෝක ඉතිහාසය II (I කොටස)
நவீன உலக வரலாறு II (பகுதி I)
Modern World History II (Part I)

25 C | S | II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

විභාග අංකය: ......................................

**උපදෙස්:**

- මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- මෙම කොටසට ලකුණු **40** ක් දෙනු ලැබේ.
- කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස, II කොටසේ** පිළිතුරු පත්‍ර සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක් දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) යුප්‍රටීස් (2) ටයිග්‍රීස් (3) නයිල්
(4) සින්ධු (5) පැනමා (......)

**2.** (1) කැස්ටීල් (2) ඇරගන් (3) ග්‍රැනඩා
(4) නෝමැන්ඩි (5) නවාරේ (......)

**3.** (1) ජියෝවන්නි බොකැෂියෝ (2) ෆ්‍රැන්සිස් පෙට්‍රාක් (3) ජාකොබ් ෆුගර්
(4) නිකොලෝ මකියාවෙලි (5) ෆ්‍රැන්සෙස්කෝ ගීචියාඩිනි (......)

**4.** (1) ෆ්ලොරිඩා (2) කියුබා (3) ජැමෙයිකා
(4) හිස්පැනියෝලා (5) බහමාස් (......)

**5.** (1) තෝමස් ජෙෆර්සන් (2) ඇන්ඩෲ ජැක්සන් (3) මාටින් ලූතර් කිං
(4) ඒබ්‍රහම් ලින්කන් (5) ජෝන් එෆ්. කෙනඩි (......)

**6.** (1) මිරාබෝ (2) කැලෝන් (3) අබේ සියෙස්
(4) ජීන් පෝල් මරාත් (5) මැක්සිමිලියන් රොබෙස්පියර් (......)

**7.** (1) මැකෝලේ (2) ඩැල්හවුසි (3) කර්සන්
(4) මින්ටෝ (5) ලිටන් (......)

**8.** (1) වින්ස්ටන් චර්චිල් (2) ජෝශප් ස්ටාලින් (3) ලොයිඩ් ජෝර්ජ්
(4) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (5) හැරී ට්‍රෑමන් (......)

[දෙවැනි පිටුව බලන්න.

9. (1) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
(2) පොදු රාජ්‍ය මණ්ඩලය (COMMONWEALTH)
(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(4) ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
(5) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) (......)

10. (1) ගුජරාට් (2) උත්තර ප්‍රදේශ් (3) මධ්‍ය ප්‍රදේශ්
(4) බිහාර් (5) භූතාන් (......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක්** යුගලයක පද **එකිනෙකට නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගලය කුමක් දැ'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) මිං - චීනය
(2) මුසල් - ඉන්දියාව
(3) කොන්බවුං - බුරුමය
(4) ඔරෙන්ජ් - ඉතාලිය
(5) ස්ටුවර්ට් - එංගලන්තය (......)

12. (1) මකාඕ - පෘතුගීසි
(2) ආර්ජන්ටිනාව - ස්පාඤ්ඤ
(3) මින්දනාඕ - ලන්දේසි
(4) ඇල්ජීරියාව - ප්‍රංශ
(5) ලිබියාව - ඉතාලි (......)

13. (1) ලෙවියතාන් - තොමස් හොබ්ස්
(2) නීතියේ සාරය (Spirit of the Laws) - ජීන් ජැක් රූසෝ
(3) සත්ව සන්තතියේ සම්භවය (Origin of Species) - චාල්ස් ඩාවින්
(4) ගෝරා - රබීන්ද්‍රනාත් ටාගෝර්
(5) ලෝක ඉතිහාසයේ සිහිවටන (Glimpses of World History) - ජවහර්ලාල් නේරු (......)

14. (1) ඇඩම් ස්මිත් - රාජ්‍ය නිර්බාධවාදී න්‍යාය
(2) ජෙරමි බෙන්තම් - උපයෝගිතාවාදය
(3) කාල් මාක්ස් - සමාජවාදය
(4) වී. අයි. ලෙනින් - බටහිර සමඟ සාමකාමී සහජීවනය
(5) බාල් ගංගාධාර් තිලක් - ස්වරාජ් සංකල්පය (......)

15. (1) ගෝල්ඩ් කෝස්ට් - නයිජීරියාව
(2) ටැංගනයිකා - ටැන්සානියාව
(3) ඇබිසීනියා - ඉතියෝපියාව
(4) නියාසාලන්තය - මලාවි
(5) රොඩේසියා - සිම්බාබ්වේ (......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නො වේ**. **Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| X | Y |
|---|---|
| (i) උත්කෘෂ්ට විප්ලවය | A 'නියෝජනයක් නැතිනම් බදුත් නැත' |
| (ii) අමෙරිකන් විප්ලවය | B රජු අභිබවා පාර්ලිමේන්තුව ජය ගැනීම |
| (iii) ප්‍රංශ විප්ලවය | C කුවොමින්තාං පාලනය පරදා කොමියුනිස්ට් ජයග්‍රහණය |
| (iv) රුසියන් විප්ලවය | D නිදහස, සමානාත්මතාව, සහෝදරත්වය |
| (v) චීන විප්ලවය | E සාමය, ඉඩම් සහ පාන් |

(1) ABCDE (2) BADEC (3) BDAEC (4) ECDBA (5) EDACB (......)

17.

| X | Y |
| --- | --- |
| (i) අච්මඩ් සුකර්ණෝ | A සිංගප්පූරුවේ අගමැති |
| (ii) මැනුවෙල් රොක්සාස් | B චීනයේ අගමැති |
| (iii) චෞ එන් ලායි | C උතුරු වියට්නාමයේ ජනාධිපති |
| (iv) හෝ චි මින්හ් | D පිලිපීනයේ ජනාධිපති |
| (v) ලී කුවාන් යූ | E ඉන්දුනීසියාවේ ජනාධිපති |

(1) DABEC (2) DACBE (3) DEACB (4) ECDAB (5) EDBCA (......)

18.

| X | Y |
| --- | --- |
| (i) ට්‍රිග්වි ලී | A පේරු |
| (ii) ඩැග් හැමර්ෂල් | B නෝර්වේ |
| (iii) ඌ තාන්ට් | C ඔස්ට්‍රියාව |
| (iv) කුට් වොල්ඩ්හයිම් | D බුරුමය |
| (v) පෙරේස් ඩි කුවෙලාර් | E ස්වීඩනය |

(1) ACEBD (2) BCAED (3) BEACD (4) BEDCA (5) DEACB (......)

19.

| X | Y |
| --- | --- |
| (i) ජවහර්ලාල් නේරු | A ඉන්දියාවේ ප්‍රථම ජනාධිපතිවරයා |
| (ii) මොහොමඩ් අලි ජින්නා | B ඉන්දියාවේ ප්‍රථම අගමැතිණිය |
| (iii) රාජේන්ද්‍ර ප්‍රසාද් | C ඉන්දියාවේ ප්‍රථම අගමැතිවරයා |
| (iv) ඉන්දිරා ගාන්ධි | D බංග්ලාදේශයේ ප්‍රථම අගමැතිවරයා |
| (v) ෂීක් මුජිබර් රහමන් | E පකිස්තානයේ ප්‍රථම මහාණ්ඩුකාරවරයා |

(1) CEABD (2) DAEBC (3) DEBAC (4) ECADB (5) EDABC (......)

20.

| X | Y |
| --- | --- |
| (i) ඝානා | A ජුලියස් නියරේරේ |
| (ii) කොංගෝ | B මිල්ටන් ඔබෝටේ |
| (iii) ටැන්සානියා | C ජොමෝ කෙන්යාටා |
| (iv) උගන්ඩා | D පැට්‍රිස් ලුමුම්බා |
| (v) කෙන්යා | E ක්වාමේ නිකෘමා |

(1) ACBED (2) BDAEC (3) CADBE (4) ECABD (5) EDABC (......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. **එංගලන්තයේ හත්වන හෙන්රි රජතුමා**

(1) එංගලන්තයේ ජාතික රාජ්‍යය පිහිටුවනලදැයි සැලකේ.

(2) ටියුඩර් රාජවංශය ස්ථාවර පදනමක් මත පිහිටුවීය.

(3) තමන් එංගලන්ත ආගමික සභාවේ නායකයා ලෙස ප්‍රකාශයට පත් කළේය.

(4) ශක්තිමත් රාජාණ්ඩු පාලනයක් ගොඩනැගීය.

(5) ස්ටාර් චේම්බර් නම් අධිකරණ මණ්ඩලයක් පිහිටුවා නොහික්මුණු රදළ ප්‍රභුවරුන් මැඩ පැවැත්වීය. (......)

22. **ලතින් අමෙරිකාවේ ස්පාඤ්ඤ අධිරාජ්‍යය**

(1) කොලම්බස් කැරිබියන් දූපත් සොයා ගත්තේ ය.

(2) අමෙරිගෝ වෙස්පුචි බ්‍රසීලයට ගොඩබැසීය.

(3) කෝර්ටීස් මෙක්සිකෝව ජයග්‍රහණය කළේ ය.

(4) පිසාරෝ පේරුව ජයග්‍රහණය කළේ ය.

(5) 1540–1541 දී ස්පාඤ්ඤයෝ මධ්‍යම චිලී ප්‍රදේශය ජයගත්හ. (......)

**23.** ප්‍රංශ විප්ලවය
(1) මූල්‍ය අර්බුදය සහ එස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
(2) ජාතික සභාව (National Assembly) පිහිටුවීම
(3) පළමුවන හා දෙවන මහාද්වීපික සම්මේලන
(4) ගිරොණ්ඩින් හා ජැකොබින් පාලන අවධි
(5) අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය (……)

**24.** බුරුමය
(1) බ්‍රිතාන්‍යයන් බුරුමය ජයග්‍රහණය කිරීම අවස්ථා කීපයක දී සිදුවිය.
(2) 1937 දී බුරුමය බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත් විය.
(3) 1948 දී බුරුමය නිදහස ලබාගත්තේ ය.
(4) අවුන් සාන් බුරුමයේ ප්‍රථම අගමැතිවරයා බවට පත් විය.
(5) බුරුමය, වර්තමානයේ දී මියන්මාරය නමින් හඳුන්වනු ලැබේ. (……)

**25.** ඉන්දිය ජාතික නිදහස් සටන
(1) ඉන්දියානු ජාතික සංගමය විසින් ඉන්දියානු ජාතික සටන මෙහෙයවන ලදී.
(2) සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය
(3) සහයෝගිතා වර්ජන ව්‍යාපාරය
(4) දෙවන ලෝක යුද්ධ සමයේ ජපානය විසින් ඉන්දියාව යටත් කරනු ලැබීම
(5) 'ඉන්දියාවෙන් පිටවනු' ව්‍යාපාරය (……)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,
  **(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් …………………………………… **1** ද,
  **(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් …………………………………… **2** ද,
  **(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් …………………………………… **3** ද,
  **(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් …………………………………… **4** ද,
  **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ………… **5** ද **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

**26.** පෙරදිග පෘතුගීසි යටත්විජිත අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?
(A) අල්ෆොන්සෝ ද ඇල්බකර්ක් පෙරදිග පෘතුගීසි අධිරාජ්‍යයේ ප්‍රධාන නිර්මාපකයා ලෙස සලකනු ලැබේ.
(B) පෙරදිග පෘතුගීසි අධිරාජ්‍යයේ මූලස්ථානය ගෝවෙහි ස්ථාපිත කොට තිබුණි.
(C) වස්කෝ ද ගාමා පෘතුගීසි යටත් විජිතවල පළමුවන මහාණ්ඩුකාරවරයා විය.
(D) ස්පාඤ්ඤයෝ පෘතුගීසීන් පෙරදිගින් පන්නා දැමූහ. (……)

**27.** ඉන්දුනීසියාව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?
(A) දහහත්වන සියවසේ අග සිට ඉන්දුනීසියාව හෙවත් නැගෙනහිර ඉන්දීය දූපත් ලන්දේසීන් විසින් පාලනය කරන ලදී.
(B) දෙවන ලෝක යුද්ධ සමයේ දී ඉන්දුනීසියාව, චීනය විසින් යටත් කර ගන්නා ලදී.
(C) 1949 දී ඉන්දුනීසියාව සිය ස්වාධීනත්වය දිනාගත්තේ ය.
(D) 1967 දී ඉන්දුනීසියාව කොමියුනිස්ට් රටක් බවට පත්විය. (……)

**28.** අමෙරිකන් විප්ලවය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?

(A) බ්‍රිතාන්‍යයන් විසින් අනුගමනය කරන ලද බදු හා වාණිජ ප්‍රතිපත්තිවලට එරෙහිව අමෙරිකානු විප්ලවය ඇතිවිය.

(B) 1775 බොස්ටන් තේ පැන් සංග්‍රහය වැනි කැලඹිලි සන්නද්ධ විරෝධතා බවට වර්ධනය විය.

(C) 1776 ජූලි 4 දා ස්වාධීනතා ප්‍රකාශය නිල වශයෙන් සම්මත කරන ලදී.

(D) ප්‍රංශයෝ බ්‍රිතාන්‍යයන්ට එරෙහිව අමෙරිකානුවන්ට ආධාර කළහ. (……)

**29.** පළමුවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

(A) යුරෝපීය බලවතුන් බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් ප්‍රධාන හේතුවකි.

(B) ඔස්ට්‍රියානු ආදිපාද ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් සරයේවෝහි දී ඝාතනය කිරීමෙන් පළමුවන ලෝක යුද්ධය ආරම්භ විය.

(C) රුසියාව, ප්‍රංශය, බ්‍රිතාන්‍ය හා ඉතාලිය මධ්‍ය බලවතුන් ලෙස හැඳින්විණි.

(D) හිරෝෂිමා හා නාගසාකි වෙත බෝම්බ හෙළීමත් සමඟ පළමුවන ලෝක යුද්ධය අවසන් විය. (……)

**30.** මැලේසියාව සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

(A) 1957 දී බ්‍රිතාන්‍යයෝ මලයාවට පූර්ණ නිදහස ප්‍රදානය කළහ.

(B) බෘනායි ප්‍රදේශය, මැලේසියානු සංයුක්තයට සම්බන්ධ විය.

(C) තුන්කු අබ්දුල් රහමන් මලයාවේ ප්‍රථම අගමැතිවරයා බවට පත්විය.

(D) තුන්කු අබ්දුල් රහමන්ගෙන් පසු සුහර්තෝ එම තනතුරට පත්විය. (……)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයක ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** ''බ්‍රහ්ම සමාජ්''නම් ඉන්දියාවේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ කවරෙකු විසින් ද?

(1) කේශබ් චන්ද්‍ර සෙන් (2) ස්වාමි විවේකානන්ද (3) රාජා රාම් මෝහන් රෝයි
(4) ඩෙබෙන්ද්‍රනාත් තාගෝර් (5) දයානන්ද් සරස්වතී (……)

**32.** සාපේක්ෂතාවාදී න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ කවරෙකු විසින් ද?

(1) අයිසැක් නිව්ටන් (2) තෝමස් මෝල්තස් (3) ෆ්‍රෙඩ්රික් නිට්ෂෙ
(4) මාරි කියුරි (5) ඇල්බට් අයින්ස්ටයින් (……)

**33.** 1911-12 "චීන සමූහාණ්ඩුවේ පියා" ලෙස හඳුන්වනු ලබන්නේ කවරෙක් ද?

(1) කාන් යූ වෙයි (2) සුන් යත් සෙන් (3) යුවාන් ෂිහ් කායි
(4) චෙන් තු-හ්සියු (5) චියැං කායි ෂෙක් (……)

**34.** බොල්ෂෙවික් විප්ලවයේ නායකයා කවුද?

(1) ජෝර්ජ් ප්ලෙකනොෆ් (2) ඇලෙක්සැන්ඩර් කෙරන්ස්කි (3) ලියොන් ට්‍රොට්ස්කි
(4) වී. අයි. ලෙනින් (5) ජෝශප් ස්ටාලින් (……)

**35.** සූවස් ඇල ජනසතු කරන ලද ඊජිප්තු ජනාධිපතිවරයා කවුද?

(1) මුහමඩ් නජීබ් (2) ගමල් අබ්දුල් නසර් (3) අන්වර් සදාත්
(4) මෙනහෙම් බෙගින් (5) හොස්නි මුබාරක් (……)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | මානවවාදය මිනිසාගේ උදාරබව අවධාරණය කරයි. | දේවවරම්වාදී න්‍යාය අනුව යමින් බොහෝ යුරෝපීය රජවරු, ඔවුන් දෙවියන් විසින් රාජ්‍ය පාලනය සඳහා තෝරා ගනු ලැබූහ යි කියා සිටියහ. | (.........) |
| **37.** | 1789 ප්‍රංශ විප්ලවය ඇති වීමත් සමඟම, ලුවී නැපෝලියන් ප්‍රංශයේ පාලකයා බවට පත්විය. | ඇතැම් ඉතිහාසඥයෝ 1857 ජනතා නැගී සිටීම පළමුවන ඉන්දීය නිදහස් සටන ලෙස අර්ථ දක්වති. | (.........) |
| **38.** | පළමුවන අබිං යුද්ධය අවසානයේ අත්සන් කරන ලද නැන්කිං ගිවිසුමෙන් හොංකොං දිවයින බ්‍රිතාන්‍යයන්ට පවරා දෙන ලදී. | දහනවවන සියවසේ දෙවන භාගය තුළ චූලාලොංකෝර්ණ් රජතුමා වියට්නාමයෙහි නවීකරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළේය. | (.........) |
| **39.** | 1898 දී ස්පාඤ්ඤයන්ගෙන් පිලිපීනය අත්පත් කර ගැනීමෙන් පසු අමෙරිකානුවෝ ජෙනරාල් ඩග්ලස් මැක් ආතර් එහි පළමුවන මහාණ්ඩුකාරවරයා ලෙස පත් කළ හ. | චාල්ස් ඩි ගෝල් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ ප්‍රථම චාන්සලර්වරයා විය. | (.........) |
| **40.** | මිනිස් ඉතිහාසයේ ඇති වූ වඩාත්ම විනාශකාරී යුද්ධය ලෙස සැළකිය හැකි දෙවන ලෝක යුද්ධය ලෝක දේශපාලනය, රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සම්බන්ධතා යන ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් සලකුණු කරයි. | දෙවන ලෝක යුද්ධයේ දී මියගිය සංඛ්‍යාව මිලියන 50 ක් තරම් අධික වූ අතර එම යුද්ධය, අමෙරිකා එක්සත් ජනපදය සහ සෝවියට් දේශය ලොව සුපිරි බලවතුන් ලෙස නැගී ඒමටත්, ආසියාවේ හා අප්‍රිකාවේ ස්වාධීන රාජ්‍යයන් බොහොමයක් නිර්මාණය කරමින් යුරෝපයේ යටත් විජිත අධිරාජ්‍ය බිඳවැටීම කඩිනම් කිරීමටත් මඟ පෑදීය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| නූතන ලෝක ඉතිහාසය II<br>நவீன உலக வரலாறு II<br>Modern World History II | 25C | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

නූතන ලෝක ඉතිහාසය II (II කොටස)
நவீன உலக வரலாறு II (பகுதி II)
Modern World History II (Part II)

**25 C S II**

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

**උපදෙස්:**

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක** ප්‍රශ්නය බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) හ්වැං හෝ ගඟ | (ii) තායිවානය | (iii) සුමාත්‍රා |
| (iv) ඇෆ්ඝනිස්තානය | (v) සුභ ප්‍රාර්ථනා තුඩුව | (vi) රතු මුහුද |
| (vii) ස්පාඤ්ඤය | (viii) කීල් ඇළ | (ix) නෝර්වේ |
| (x) කියුබා | (xi) වොෂිංටන් | (xii) ඇමසන් ගඟ |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු* **01** *බැගින්)*

## B කොටස

**2.** "කොන්ස්තන්තිනෝපල් නගරය ඔටෝමන් තුර්කීන් අතට පත්වීම යුරෝපයේ පමණක් නොව ආසියාවේ ද ඉතිහාසය කෙරෙහි බලපෑ සිද්ධියක් ලෙස සැලකිය හැකිය." මේ ප්‍රකාශය පහත දැක්වෙන වර්ධනයන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(i) පුනරුදය (ලකුණු 08 යි)

(ii) දේශ ගවේෂණ (ලකුණු 08 යි)

**3.** "දහනවවන සියවසේ යුරෝපයේ ආර්ථිකය හා සමාජය ප්‍රධාන වශයෙන් කාර්මික විප්ලවයේ බලපෑම යටතේ සකස් විය."

(i) කාර්මික විප්ලවය ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) කාර්මික විප්ලවය එරට මුලින්ම ඇතිවීමට තුඩු දුන් හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) කාර්මික විප්ලව සමයේ දී සිදුකරන ලද ප්‍රධාන නව නිපැයුම් සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, එහි බලපෑම යටතේ දහනවවන සියවසේ යුරෝපයේ ආර්ථිකය හා සමාජය සකස් වූ අන්දම පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

**4.** පහත සඳහන් තේමා යටතේ ඉතාලි එක්සත් ව්‍යාපාරය පරීක්ෂා කරන්න.

(i) එක්සත්භාවයට එරෙහිව පැවති බාධක

(ii) නායකත්වය

(iii) එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා (ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ලන්දේසි යටත් විජිත අධිරාජ්‍යය

(ii) උත්කෘෂ්ට විප්ලවය

(iii) ආදි තන්ත්‍රය

(iv) නව අධිරාජ්‍යවාදය (ලකුණු 08 × 2 = 16යි)

[අටවැනි පිටුව බලන්න.

## C කොටස

**6.** ඉන්දියානු ජාතික නිදහස් සටනෙහි ලා මහත්මා ගාන්ධි විසින් ඉටුකරන ලද කාර්යභාරය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**7.** "ජාතීන්ගේ සංගමයේ අසාර්ථකත්වය දෙවන ලෝක යුද්ධය ඇතිවීමට මඟ පෑදීය."

(i) ජාතීන්ගේ සංගමය පිහිටුවීම සඳහා ප්‍රතිපාදන සලසා දෙනු ලැබූ ගිවිසුම නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) ජාතීන්ගේ සංගමයේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) ජාතීන්ගේ සංගමයේ අසාර්ථකත්වයට තුඩු දුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ජාතීන්ගේ සංගමයේ අසාර්ථකත්වය දෙවන ලෝක යුද්ධය ඇතිවීමට කෙතෙක් දුරට හේතු වී දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

**8.** (i) 1949 දී චීනයේ කොමියුනිස්ට් ජයග්‍රහණයට තුඩුදුන් හේතු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) මාඕ සේතුං අනුගමනය කළ දේශපාලන, සමාජ හා ආර්ථික ප්‍රතිපත්ති විග්‍රහ කොට ඒවා කොතෙක් දුරට සාර්ථක වී දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) මෙයිජි ප්‍රතිස්ථාපනය

(ii) රුසියන් විප්ලවය ඇති වූ පසුබිම

(iii) තුෂ්ණී යුද්ධය

(iv) නොබැඳි ව්‍යාපාරය

(ලකුණු 08 × 2 = 16යි)

* * *